මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

සතර අපායෙන් මිදීම

ධර්ම සාකච්ඡාවක් ඇසුරිනි

මහරහතුන්
වැඩි මඟ ඔස්සේ



ඉදිරිපත් කිරීම සමන් ප්‍රනාන්දු

මහ රහතුන් වැඩි
මඟ ඔස්සේ

(සතර අපායෙන් මිදීම)

ධර්ම සාකච්ඡාවක් ඇසුරෙනි.

ඉදිරිපත් කිරීම
සමන් ප්‍රනාන්දු

© සමන් ප්‍රනාන්දු

පළමු මුද්‍රණය - 2014 පෙබරවාරි
දහවන මුද්‍රණය - 2014 නොවැම්බර්
විසිවන මුද්‍රණය - 2017 ජූනි

ISBN-978 - 955 - 7887 - 08-1

වෙබ් පිටුව:

www.maharahathunwedimagaosse.com
www.mrwo.lk

මෙතෙක් පළ වී ඇති පොත් පිළිබඳ සම්පූර්ණ විස්තරය සඳහා
පසුපස කවරයේ ඇතුල් පැත්ත බලන්න.

විමසීම් -

දුරකථන: 0712199900

0112755768 (සතියේ දිනයන්හිදී පෙ.ව. 9.30 සිට ප.ව. 4.30 දක්වා)

මුද්‍රණය සහ බෙදාහැරීම

ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂන්ස් සෙන්ටර්

444/3B, පිටිපන දකුණ, හෝමාගම

(සෝයා තෙල් භාවිතයෙන් නිපදවනු ලැබූ, විෂ රහිත, පරිසර හිතකාමී තීන්ත භාවිතයෙන් මුද්‍රිත යි.)

මහ රහතුන් වැඩි මග ඔස්සේ ධර්ම දේශනා කළ ස්වාමීන් වහන්සේ සමඟ ධර්ම සාකච්ඡාවක් ඇසුරින්

ඉතින් මහත්තයෝ මං මොනාද දූන් කියන්න ඕන.

ප්‍රශ්න අංක 01

ගෞරවනීය ස්වාමීන් වහන්ස මේ ජීවිතයේදීම කෙනෙකුට සෝතාපන්න ඵලය ලබාගැනීමට ධර්මය තුළ හැසිරිය යුතු ආකාරය කෙබඳුද?

බුදුරජාණන් වහන්සේ මහත්තයෝ කියන්නේ මේ ගිහි ජීවිතයේ ගිහි පිංවතුන්ට බුදුරජාණන් වහන්සේ ඉලක්කය හැටියට පෙන්වන්නේ සතර අපායෙන් මිදෙන්න කියන කාරණය. එතකොට රහත් භාවයට පත්වන්න කියන කාරණය ඉලක්කයක් පෙන්වන්නෙ නැහැ. මොකද ගිහි ජීවිතයේ තමුන්ගේ යුතුකම් වගකීම් පවුල් ජීවිත ව්‍යාපාර කටයුතු ඒ ආකාරයෙන් සිද්ධ කරමින් මේ ජීවිතයේ සතර අපායෙන් මිදෙන්න කියන කාරණය තමයි බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නෙ තේරුණාද.

මේ ජීවිතයේ සතර අපායෙන් මිදෙන්න නම් බුදුරජාණන් වහන්සේගේ ධර්මය සන්දිට්ඨිකව තියෙන තාක් කල් මේ ජීවිතේ සතර අපායෙන් මිදෙන්න පුලුවන් කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එහෙනම් මහත්තයෝ ධර්මය සන්දිට්ඨිකව තියෙනවා. චතුරාර්ය සත්‍ය අපිට ඇහෙනවා. පටිච්ච සමුප්පාදය ඇහෙනවා. ඒ කියන්නෙ ප්‍රාතිමෝක්ෂ ශීලය

ආරක්ෂා කරගත්තා වූ උපසම්පදා භික්ෂූන් දහස් ගණනක් ලෝකෙ ජීවත් වෙනවා. ඒ කියන්නෙ ධර්මය සන්දිට්ඨිකව තියෙනවා. ආර්ය අෂ්ඨාංගික මාර්ගය ඇහෙනවා. අපිට එහෙනම් මහත්තයෝ ධර්මය සන්දිට්ඨිකව තියෙනවා නම් අපිට මේ ජීවිතයේ සතර අපායෙන් මිදෙන්න පුලුවන් කියන විශ්වාසය අපි ඇතිකර ගන්න ඕන. බුදුරජාණන් වහන්සේ කියනවා ධර්මය සන්දිට්ඨිකව තියෙන තාක් කල් සතර අපායෙන් මිදෙන්න පුලුවන් කියල. එහෙම නම් මුලින්ම ඒ විචිකිච්චාවෙන් බැහැර වෙලා ඒ විශ්වාසය අපි සකස් කරගන්න ඕන. මේ ජීවිතේ මට සතර අපායෙන් මිදෙන්න පුලුවන් කියන කාරණය. ඉතින් එහා තැනක් බුදුරජාණන් වහන්සේ ගිහි අයට පෙන්වන්නෙ නෑ මහත්තයෝ. මොකද එහෙම පෙන්නන්න ගියොත් එයා පටලවා ගන්නවා නේද?. මොකද මේ ගිහි බැඳීම් තුළ හිඳගෙන ඒ ව්‍යාපාර රැකී රක්ෂා කරමින් තමයි මේ මාර්ගය තුල යන්නෙ. ඒ නිසා ඉලක්කය බුදුරජාණන් වහන්සේ කියන්නෙ සතර අපායෙන් මිදෙන්න කියන ඉලක්කය. ඉතින් ඒ ඉලක්කය පෙන්නුවට පස්සෙ මහත්තයෝ බුදුරජාණන් වහන්සේ කාරණා තුනක් දේශනා කරනව සතර අපායෙන් මිදීම උදෙසා.

පලවෙනි කාරණය තමයි තෙරුවන් කෙරෙහි වූ අචල ශ්‍රද්ධාව. දෙවනි කාරණය තමයි ශීලය ආර්‍ය ශීලයක් හැටියට වඩන්න. තුන්වෙනි කාරණය තමයි පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දකින්න. ඉතින් මේ කාරණා තුන තුල තමයි මේ ජීවිතයේ සතර අපායෙන් මිදෙන්න කියන කාරණය

බුදුරජාණන් වහන්සේ පෙන්වා දේශනා කරන්නෙ. එතනදි මහත්තයෝ ශ්‍රද්ධාව අචල ශ්‍රද්ධාවක් හැටියට වැඩෙන්න ඕන. ශ්‍රද්ධාව අචල ශ්‍රද්ධාවක් කියන්නෙ ශ්‍රද්ධාවේ ආකාරයන් තුනක් තියෙනවා.

එකක් අමූලිකා ශ්‍රද්ධාව, අමූලිකා ශ්‍රද්ධාව අපිව අරන් යන්නෙ කොතන්ටද දුගතියට.

ඊලඟට ශ්‍රද්ධාව, ශ්‍රද්ධාව අපිව අරන් යන්නෙ කොතන්ටද සුගතියට.

එතකොට අපි දැන් සෝවාන් ඵලයට පත්වෙනව කියන්නෙ මහත්තයො මේ සුගතියත් දුගතියත් දෙකම අනිත්‍යයි කියල දකිනවා තේරුනාද. ඉතින් එතනදි අපි නිරතුරුවම සෝවාන් ඵලයට පත්වෙනව කියන්නෙ කෙනෙක්ගෙ ඉන්ද්‍රිය ධර්මයන් පහ සමවෙනව. මොනවද ඉන්ද්‍රිය ධර්මයන් පහ. ශ්‍රද්ධා, වීර්යය, සති, සමාධි, ප්‍රඥාව. මේ ඉන්ද්‍රිය ධර්මයන් පහ එයාගෙ සම වෙන්න ඕන. එයාගෙ සමවෙනවා කියන්නෙ ඉන් එහා එයා ඉන්නෙ කොතන්ටද එයා ශ්‍රද්ධානුසාරී ධම්මානුසාරී කියන තැන. තාම එයාගෙ ඉන්ද්‍රිය ධර්ම සමවෙලා නෑ. ශ්‍රද්ධානුසාරී කියන්නෙ එයාගෙ ශ්‍රද්ධාව කියන ඉන්ද්‍රිය වැඩිල තියෙනව ප්‍රඥාව කියන ඉන්ද්‍රිය වැඩිල නෑ. ධම්මානුසාරී කියල කියන්නෙ එයා හොඳට ධර්මය දන්නවා ධර්ම දැනීම තියෙනව ධර්ම කතිකත්වය තියෙනවා ධර්මය ලියනවා නමුත් එයාට ප්‍රඥාව සහ ශ්‍රද්ධාවේ දුර්වලතාවයන් තියෙනවා. නමුත් බුදුරජාණන්

වහන්සේ මේ සතියයි සිහියයි කියන කාරණේ මේ මැද්දෙන් තියෙන්නෙ මොකටද. සතියෙන් සිහියෙන් යුතුව එයා කල්‍යාණමිත්‍ර ආශ්‍රය ලබමින් සද්ධර්මය නුවණින් ශ්‍රවණය කරමින් ශ්‍රවණය කලාවූ සද්ධර්මය නුවණින් මෙනෙහි කරන්න ඕන. ශ්‍රවණය කලාවූ සද්ධර්මය නුවණින් මෙනෙහි කරද්දි තමයි මහත්තයෝ අපි මේ ශ්‍රද්ධාවත් මේ ඉන්ද්‍රිය ධර්මයන් පහ සමකරගන්න දක්ෂවෙන්නෙ. එතකොට අපි තාම මේ ඉන්ද්‍රිය ධර්මයන් සම කරගෙන නැත්තම්. ඒ කියන්නෙ අපි තාම සතියෙන් සිහියෙන් මේක නුවණින් මෙනෙහි කිරීමේ දක්ෂතාව අපි තාම ලබල නෑ. එහෙනම් මහත්තයෝ හැම වෙලාවෙම ශ්‍රද්ධාව කියන කාරණය අපි වඩාගන්න ඕන ප්‍රඥාව කියන කාරණය මෝදුකරමින්. මොකද ප්‍රඥාව කියන කාරණයත් මෙතනින් ඉහලට එන්න ඕන.

එහෙනම් හැම වෙලාවෙම අපි ශ්‍රද්ධාවත් විදර්ශණා නුවණින් දකින්න ඕන. මොකද ශ්‍රද්ධාව අපිව අරන් යන්නෙ මහත්තයෝ සුගතියට. අමූලිකා ශ්‍රද්ධාව දුගතියට. ඒ නිසා ශ්‍රද්ධාවතුල අපි ඉස්සෙල්ලාම පිහිටල මහත්තයෝ මේ ශ්‍රද්ධාවත් අනිත්‍යයි කියන කාරණය දකින්න ඕන. ශ්‍රද්ධාවත් විදර්ශණා නුවණින් දකින්න ඕන. ශ්‍රද්ධාව විදර්ශණා නුවණින් දකිනව කියන්නෙ මහත්තයෝ බුදුරජාණන් වහන්සේ බලන්න සාරාසංඛ කල්ප ලක්ෂ ගාණක් අප්‍රමාණ පාරමී ධර්මයන් පුරල උන්වහන්සේ ලබාගත්තාවූ දෙතිස්මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් බබලන ඒ රූපකායත් මහත්තයෝ අපි අලු ගොඩක් ධාතුන් වහන්සේලා ගොඩක් බවට පත්කරල දකින්න දක්ෂ වෙන්න ඕන

තේරුණාද. බලන්න ඒ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් ලබාගන්න උන්වහන්සේ සාරාසංඛ කල්ප ලක්ෂ ගාණක් කොයි සා නම් පාරමී ධර්මයන් පිරුවද. එතකොට ඒ සා පාරමී ධර්මයන් ශක්තියෙන් ලබාගත්තා වූ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් බබලන ඒ රූපකායත් මහත්තයෝ අවසානයේ ඇට ටිකක් ධාතූන් වහන්සේලා ගොඩක් අළු ගොඩක් බවට පත්වුනා කියල මනසින් දකින්න ඕන. අපි ඒක දකින්න බය නම් කවදාවත් අපිට සතර අපායෙන් මිදෙන්න බැහැ. මොකද අපි විදර්ශණා නුවන සකස් කරගත් නැහැ.

අපි ශ්‍රද්ධාව කියන තැන නැවතිල ඉන්නෙ. එහෙනම් බුදුරජාණන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් බබලන ඒ රූපකායත් අලු ගොඩක් ධාතූන් ගොඩක් බවට පත්වුනා නම් මමය මගේය කියල මේ දරාගෙන ඉන්න රූපය පිංවතුනි කොයි සා අඩු ලංසුවක් දෙනවද කියන කාරණය අපි දකින්න ඕන. කුමක්ද මේ මමය මගේ පුතා මගේ දුව මගේ බිරිඳ මගේ මුනුබුරා කියල මේ අපි දරාගෙන ඉන්නාවූ රූපය මගේ ඇස මගේ කන මගේ දිව ශරීරය මනස කියල මේ දරාගෙන ඉන්නාවූ රූප පිංවතුනි කොයි සා නම් අනිත්‍ය භාවයට පත්වෙන දෙයක්ද කියල දකින්න ඕන. බුදුරජාණන් වහන්සේගේ රූපකාය අනිත්‍යභාවය දකිනව වගේම ඒ බුදුරජාණන් වහන්සේගේ රූපකාය ඇසුරින් අපේ රූපකාය අනිත්‍යභාවය අපි දකින්න වෙනවා. එතකොට තමයි ශ්‍රද්ධාවත් එක්ක විදර්ශණා නුවණ අපි තුල සකස් වෙලා එන්නෙ. එහෙම නැත්තම් අපි බුදුරජාණන් වහන්සේ කියන තැන ශ්‍රද්ධාවට

බැඳිලයි ඉන්නෙ. ඒක භවයමයි සකස් කරන්නෙ. ඊලඟට බුදුරජාණන් වහන්සේ බලන්න සාරාසංඛ කල්ප ලක්ෂ ගාණක් පාරමී ධර්මයන් පුරල අවබෝධ කොට ගත්තාවූ ඒ සම්මා සම්බුද්ධ ඥාණය නිත්‍යද අනිත්‍ය දෙයක්ද. ඒකත් අනිත්‍ය වුනා. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන වෙලාවෙ උතුම් වූ සම්මා සම්බුද්ධ ඥාණයත් පිරිනිවී යනවා. ධර්මය තාම සන්දිට්ඨිකව තියෙනවා ඒත් සන්දිට්ඨිකව තියෙන ධර්මයත් අතුරුදහන් වෙලා යනවා. ආයිමත් මෛත්‍රී බුදුරජාණන් වහන්සේයි ශාසනය මතුකරල ගන්නෙ. එහෙනම් බලන්න සාරාසංඛ කල්ප ලක්ෂ ගණනාවක් පාරමීදම් පුරලා අවබෝධ කොට වදාළාවූ සම්මා සම්බුද්ධ ඥාණයත් අනිත්‍ය නම් එහෙනම් අපි පාසලට ගිහින් විශ්ව විද්‍යාලයට ගිහින් ලබාගත් දැනුම බුද්ධිය කීර්ති ප්‍රශංසා මේ කියන දේවල් මහත්තයෝ කොයි සා නම් ලඝු තැනකට දාන්නද. එහෙම දකිමින් තමා තුල අනිත්‍ය සංඥාව වඩාගන්න ඕන. බුදුරජාණන් වහන්සේගේ රූපකාය අනිත්‍ය දකිනවා වගේම බුදුරජාණන් වහන්සේ අවබෝධ කොට වදාළා වූ සම්මා සම්බුද්ධ ඥාණය තුලත් අනිත්‍ය භාවය දකිනවා. ඒ අයුරින් අපි ලබාගත්තා වූ දැනුම බුද්ධිය කීර්ති ප්‍රශංසා කියන කාරණයන්ගේ අනිත්‍ය භාවය දකිනවා. අපි මේවා දකින්න බය නම් මහත්තයො කවදාවත් අපි තුල විදර්ශණාව සකස් වෙන්නෙ නැහැ. එහෙනම් අමූලික ශ්‍රද්ධාවෙන් බැහැර වෙන්න ඕන. ශ්‍රද්ධාවට එන්න ඕන. ශ්‍රද්ධාවත් විදර්ශණා නුවනි-න් දැකල මහත්තයෝ අපි දැනගන්න ඕන ප්‍රඥාව කියන කාරණය මතුකර ගන්න. ඒක තමයි අචල ශ්‍රද්ධාව කියන්නෙ තේරුණාද.

බුදුරජාණන් වහන්සේ දේශනා කලාවූ ධර්මය තමා තුලින් දකින තැනට එන්න ඕන. තමාගේ ඇසේ අනිත්‍ය භාවය තමා තුලින් දකින තැනට එන්න ඕන. තමාගේ කනේ තිබෙන අනිත්‍ය භාවය කනින් ඇසෙන්නා වූ රූපයන්ගේ අනිත්‍ය භාවය තමා තුලින් අනිත්‍ය දකින ස්වභාවයට එන්න ඕන. මහත්තයෙෝ ඉතින් ඒක දකින්න නම් අපි බුදුරජාණන් වහන්සේගේ රූපකායත් අනිත්‍යයි කියල දකින්න ඕන. ඒ අනිත්‍ය ඔස්සේ අපේ රූපයේත් අනිත්‍ය භාවය දකින්න වෙනවා මහත්තයෝ. එහෙම දකිමින් ඉන්න කොට අපි අවබෝධයෙන් රූපය කෙරෙහි කලකිරෙනවා. එහෙනම් මේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් බබලන මේ රූපකායත් අනිත්‍ය වෙලා ගියා නම් තව මගේ රූපය කෙරෙහි මට විශ්වාසයක් බලාපොරොත්තුවක් තියාගන්න බෑ කියන තැනට එනවා.

දෙවනි කාරණය මහත්තයෝ ආර්‍ය ශීලය. ආර්‍ය ශීලය බුදුරජාණන් වහන්සේ කියන්නෙ ශීලය විදර්ශණා නුවනට ලක්කරන්න. මොකද ශීලය තුලිනුත් අපට මේ පැත්තෙන් ප්‍රඥාව කියන කාරණය මෝදු කරගන්න වෙනව. ඒ නිසා ශිල් රකින්න සිල් රකින්න. ශීලයට බැඳෙන්න බැඳෙන්න අපි කොහාටද යන්නෙ. සුගතියට. දුස්සීලභාවයට පත්වන්න දුස්සීලභාවයට පත්වන්න අපි කොතෙන්ටද යන්නෙ. දුගතියට. එහෙනම් දැන් අපි යන්න හදන්නෙ සුගතියත් දුගතියත් දෙකම අනිත්‍යයි කියල දකින තැනට. එහෙනම් මහත්තයෝ ශීලයත් විදර්ශනා නුවනින් දකින්න දක්ෂවෙන්න ඕන. සිල් සමාදන් වෙනවා. සමාදන් වූ ශීලය ආරක්ෂා කරගන්නවා. ආරක්ෂා

කලාවූ ශීලය පිංවතුනි හැමවෙලාවෙම විදර්ශණා නුවනට ලක්කරනවා. මොකද්ද විදර්ශණා නුවනට ලක්කරන්නෙ. ශීලයෙන් ලැබෙන්නාවූ ආනිසංස විදර්ශණා නුවනට ලක්කරනවා. ශීලයෙන් මොනවද අපි ලබන ආනිසංස. සුගතියේ ඉපදෙනවා. සිහි මුලා නොවී මැරෙණවා. අපේ කීර්ති රාවය පැතිරෙනවා. අපි ඕන සභාවක් ඉදිරියට නොබියව යනවා. ඒ වගේම සතර අපායට වැටෙන්නෙ නැහැ. එතකොට මේ කියන්නාවූ ආදීනවයන් නිත්‍යද අනිත්‍යද. අනිත්‍යයි. වෙනස් වෙන දේවල්. එතකොට මේ වෙනස් වෙන දේවල් වලට බැඳෙනවා කියන්නෙ දුකකට බැඳෙනවා. ඒ නිසා තමන් සිල් සමාදන් වෙලා කොයි වෙලාවකවත් අනාගත පංච උපාදානස්කන්ධයකට බැඳෙන්නෙ නැහැ. සිල් සමාදන් වෙලා දෙවියෙක් වේවා කියල හිතක් සකස් වෙනකොට ඔබ ශක්‍රයා වෙලා ඉඳලා සතර අපායට වැටුනු හැටි නුවනින් මෙනෙහි කරනවා. ශිල් සමාදන් වෙලා මනුස්සයෙක් වේවා කියල චිත්තයක් සකස් වෙනකොට ඔබ සක්විති රජ වෙලා ඉඳලා සතර අපායට වැටුනු හැටි සිහිපත් කරනවා. සිල් සමාදන් වෙලා බ්‍රහ්මයෙක් වේවා කියල චිත්තයක් සකස් වුනොත් ඔබ රූපාවචර අරූපාවචර බ්‍රහ්ම තලවල කල්ප ගණන් ඉඳලා ආයෙත් සතර අපායට වැටුනු හැටි නුවනින් සිහිපත් කරනවා. එතකොට ඔබ ආයිමත් ශීලය නිසා සංසාරෙට බැඳෙන්නෙ නැහැ.

ඔබ සිල් රැකලා මනුස්සයෙක් වේවා කියල ප්‍රාර්ථනා කරනව නම් ඒ ප්‍රාර්ථනා කරන්නෙ අනාගත පංච උපාදානස්කන්ධයක්.

සිල් රැකලා දෙවියෙක් බ්‍රහ්මයෙක් වේවා කියල ප්‍රාර්ථනා කරනව නම් ඒ ප්‍රාර්ථනා කරන්නෙ අනාගත පංච උපාදානස්කන්ධයක්. එහෙනම් සිල් රැකලා ඔබ අනාගත භවයක් ප්‍රාර්ථනා කරන්නෙ නැහැ. සිල් රකිනවා. සිල් ආරක්ෂා කරනවා. ශීලයෙන් ලැබෙන්නාවූ ආනිසංසයන්ගේ අනිත්‍ය භාවය දකිමින් ජීවත්වෙනවා. ඒක තමා මහත්තයෝ ආර්‍ය ශීලය. ඒ වගේ කොච්චර සිල් සමාදන් උනත් ඒ ශීලය තුලින් ආරක්ෂා කරල දෙන්නෙ මොනාද. කාය කර්ම, වචී කර්ම, මනෝ කර්ම ආරක්ෂා කරල දෙන්නෙ නැහැ. මනෝ කර්ම කියල කියන්නෙ මොකක්ද. අකුසල මූලයන් ලෝභ ද්වේෂ මෝහ. ඒ නිසා අපි සිල් සමාදන් වුනාට පස්සෙ ඒ ශීලය ආරක්ෂා කරගෙන යනකොට අපි දකින්න ඕන කොයි සා ලෝභ ද්වේෂ මෝහ අපි තුල සකස් වෙනවද කියන කාරණය.

නමුත් සිල් පද වලින් ඒක ආවරණය කරල දෙන්නෙ නැහැ. අපි බලන්නෙ සිල් පද ටික රැකුණාද කියන කාරණය විතරයි. සිල් පද ටික රැකුණාද කියන කාරණය බලනව මිසක් අපි තුල ලෝභ ද්වේෂ මෝහ ඇතිවුනාද කියන කාරණය බලන්නෙ නැහැ. නමුත් බුදුරජාණන් වහන්සේ කියනව ශීලය තුලින් රැකුන කාය කර්ම, වචී කර්ම වලට වඩා මනෝ කර්ම බලවත් කියල මහත්තයෝ. ඒ නිසා සිල් පද සමාදන් වෙච්ච නිරතුරුවම කාය කර්ම, වචී කර්ම වගේම මනෝ කර්මයත් රැකගන්න අපි දක්ෂ වෙන්න ඕන. ඒ නිසා ශීලය දස කුසල් කියන තැනට අපි අරන් යන්න අපි දක්ෂ වෙන්න ඕන. ඒ කියන්නෙ සිතින් කයින් වචනයෙන්

සිදුවෙන්නා වූ සියලුම අකුසල් වල අනිත්‍ය භාවය දකිනවා තේරුණාද?. ඉතින් ඒක තමයි ශීලය ආර්ය ශීලයක් කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නෙ. ඉස්සෙල්ලාම ශීලය විදර්ශනා නුවණට ලක්කරන්න අපි දක්ෂ වෙන්න ඕන. ඊළගට ශීලය තුලින් අපි අනිවාර්යයෙන්ම ලෝභ ද්වේෂ මෝහයන් සකස් කරගන්න දෙන්නෙ නැහැ. එහෙනම් මනෝකර්ම කෙරෙහි අපේ අවධානය යොමු වෙන්න ඕන. තුන්වෙනි කාරණය මහත්තයො පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකිමින් ජීවත් වෙනවා. පංච උපාදානස්කන්ධය කියල කියන්නෙ රූප, වේදනා, සංඥා, සංකාර, විඤ්ඤාණ කියන කාරණා පහ. එතකොට මේ පංච උපාදානස්කන්ධයේ මුල්ම උපාදානස්කන්ධය මොකක්ද රූප උපාදානස්කන්ධයයි. රූපය කෙරෙහි ඇතිකරගන්නා වූ තෘෂ්ණාව නිසා අපි වේදනා, සංඥා, සංකාර, විඤ්ඤාණ සකස් කරගන්නෙ.

දැන් රහතන් වහන්සේ කියන කෙනා චතුරාර්ය සත්‍ය අවබෝධ කරන වෙලාවෙ ඥාන දර්ශන තුලින් රූපය අනිත්‍ය අවබෝධ කළා. රූපය අනිත්‍ය අවබෝධ කළා නම් එයා එස්සයේදී කවදාවත්ම රූපයට බැඳෙන්නෙ නැහැ. රූපයට බැඳෙන්නෙ නැත්නම් එතන වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ සකස් වෙන්නෙ නැහැ. ඒ නිසා රහතන් වහන්සේට පංච උපාදානස්කන්ධයක් සකස් වෙන්නෙ නැහැ. නමුත් ඉන් එහා අපි මොකද කරන්නේ රූපය එස්සය වන තැනදි එස්සය නිත්‍ය වශයෙන් අපි ඒ කියන්නෙ පංච උපාදානස්කන්ධයක් සකස් කරගන්නවා. එහෙනම් මහත්තයෝ රූපය නිත්‍ය වශයෙන්

ගත්තොත් පමණයි වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ සකස් කරගන්නෙ. රූපය අනිත්‍යයි කියල දැක්කනම් වේදනා, සංඥා, සංකාර, විඤ්ඤාණ පිළිබඳ ප්‍රශ්ණයක් නැහැ. එහෙනම් මහත්තයො පහක් ගැන හිතනවට වඩා අපි දක්ෂ වෙන්න ඕන එකක් ගැන හිතල ඉතුරු හතර අවබෝධ කරගන්න. ඒ නිසා බුදුරජාණන් වහන්සේ ඒකයි කියන්නෙ රූපයේ අනිත්‍යභාවය දකිමින් ජීවත් වෙන්න. මේ ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස කියන මේ රූපයන්ගේ අනිත්‍යභාවය දකිමින් ජීවත් වෙන්න මොකද අවසානයේ අපි මේ චිරාත් කාලයක් ජීවත් වෙලා මැරෙන වෙලාවට අවසාන චුති සිත මේ මනෝ විඤ්ඤාණයක් හැටියට තමයි සකස් වෙන්නෙ. මනසේ සකස්වෙන්නා වූ සිතුවිල්ලක් හැටියට. මනෝ විඤ්ඤාණය මොකක් හෝ බාහිර රූපයක් ඇසුරු කරගෙන තමයි සකස් වෙන්නෙ. මොකක් හෝ බාහිර රූපයක්. තමන් කැමති තමන් අකැමැති. නැත්තම් කළා වූ කුසලයක් එක්කො අකුසලයක්. මේ මොකක් හෝ රූපයක් අරමුණු වෙලා තමයි අවසාන චුති සිත සකස් වෙන්නෙ. ඒ සකස් වෙන්නා වූ චුති සිත අනිත්‍යයි කියල දකින්න අපි දක්ෂ වෙන්න ඕන. මහත්තයෝ අනිත්‍යයි කියල දැක්කෙ නැත්තම් ඒ චුති සිතට අදාළ ඊළඟ ප්‍රතිසන්ධිය යනවා. එහෙනම් මහත්තයො අවසාන සකස් වෙන්නා වූ චුති සිත අනිත්‍යයි කියල දකිනව කියන්නේ ලෝකයේ දුර්ලභම කාරණයයි. තේරුණාද, ඒක අපිට සම්මා සම්බුද්ධ සාසන ලක්ෂ ගාණක් පසු කරල එද්දිත් අපට ඒක කරගන්න ලැබිල නැහැ. එහෙනම් මේක දුර්ලභ දෙයක් ඒක ලේසිත් නෑ අමාරුත් නෑ. ඒ නිසා බුදුරජාණන් වහන්සේ කියනවා යමෙක් ඇසුරු

සැනක් අනිත්‍ය වැඩුවොත් එයා සතර අපායෙන් මිදෙන්න කැමති වෙන්න ඕන. ආයෙමත් බුදුරජාණන් වහන්සේ කියනවා යමෙක් ඇසුරු සැනක් මෛත්‍රීය වැඩුවොත් එයා බ්‍රහ්ම ලෝකෙට යන්න කැමති වෙන්න ඕන කියල. ආයෙමත් බුදුරජාණන් වහන්සේ කියනවා මේ මැරෙන සත්වයින්ගෙන් මහ පොළවෙන් ගන්න පස් ප්‍රමාණයෙන් නියසිලට ගන්න ප්‍රමාණයයි සුගතිගාමී වෙන්නෙ කියල. එහෙනම් දැන් මෙතන ප්‍රකාශයන්ගේ පරස්පර භාවයක් තියෙනවා. මොකද අසුරු සැනක් අනිත්‍ය වඩපු නැති කෙනෙක් මේ ලෝකෙ ඉන්නවද. අසුරු සැනක් මෛත්‍රීය වඩපු නැති කෙනෙක් මේ ලෝකෙ ඉන්නවද. එහෙනම් ඔක්කොම සුගතියටයි යන්න ඕන. නමුත් එහෙම නෑ කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

එහෙනම් බුදුරජාණන් වහන්සේ මෙතන ඇසුරු සැනක් කියල කියන්නෙ මොකක්ද චුති සිත. චුති සිතමයි බුදුරජාණන් වහන්සේ ඇසුරු සැනක් කියල කියන්නෙ. එහෙනම් චුති සිතේදි ඇසුරු සැනක් වගේ අනිත්‍ය සංඥාවක් වැඩෙන්න නම් මහත්තයෝ එයා දීර්ඝ කාලයක් අනිත්‍ය සංඥාව ප්‍රගුණ කරල තියෙන්න ඕන. චුති සිතේදි අවසාන චුති සිතේ ඇසුරු සැනක් මෛත්‍රීය වැඩෙන්න නම් දීර්ඝ කාලයක් එයා මෛත්‍රිය වඩල පුරුදු වෙලා තියෙන්න ඕන. එහෙනම් මහත්තයෝ අපි දක්ෂ වෙන්න ඕන අවසාන සකස්වෙන චුති සිතේදි අනිත්‍යයි කියන කාරණය දකින්න ඕන. එහෙම දකින්න නම් අපි කැමති අකමැති සෑම රූපයක්ම අනිත්‍යභාවයෙන් දකින්න පුරුදු වෙන්න ඕන තේරුණාද?.

තෙරුවන් කෙරෙහි සකස්වන ශ්‍රද්ධාව විදර්ශනා නුවණින් දකින්න ඕන ශීලය විදර්ශනා නුවණින් දකින්න ඕන. දකිමින් රූපයේ අනිත්‍යභාවය අපි දකින්න දක්ෂ වෙන්න ඕන. ඒ නිසා ජීවිතයේ දකින හැම දෙයක්ම කමටහනක් කරගන්න දක්ෂ වෙන්න ඕන. ගිහි ජීවිතයේ අපිට සුමාන ගණන් සති ගණන් පැය ගණන් මාස ගණන් භාවනා කරන්න බැහැ. ඒ නිසා අපි දක්ෂ වෙන්න ඕන මහත්තයෝ හමුවෙන කොයිදේත් කමටහනක් බවට පත් කරගන්න. පාරෙ යනකොට යාචකයෙක් දැක්කොත් ඒ යාචකයා තුළින් තමා දකින්න දක්ෂ වෙන්න ඕන.

තමා මේ පැමිණි භව ගමනේදි මෙවැනි යාචකයෙක් වෙලා අගුපිල්වල කන්න නැතුව මේ විදියෙ අපිරිසිදුව කොපමණ නම් කාල වකවානුවක් ලැගල හිටියද කියල දකින්න ඕන. මේ ජීවිතයේ සතර අපායෙන් මිදුණෙ නැත්තම් මේ විදිහෙ යාචකයෙක් වෙලා මට තව කල්ප කොච්චර නම් කාලයක් ඇවිදින්න වෙයිද කියල මනසින් දකින්න ඕන. මළමිනියක් දැක්කොත් ඒ මළමිනිය තුළින් තමා දකින්න දක්ෂ වෙන්න ඕන. මම සංසාරෙ මැරුණ, මෙවැනි මළමිනී එක ගොඩක් ගැසුවොත් එය ගිජ්ජකූට පර්වතයට විශාලයි කියල කියනවා. එහෙනම් සංසාරෙ මේ සා මළමිනී මම නිසා එකතු වුණාය කියල දකින්න ඕන ඒ වගේම මේ ජීවිතයේ සතර අපායෙන් මිදුණෙ නැත්තම් තවත් ඒ සා මළකඳන් ගොඩක් ගොඩගැහෙනවාය කියන කාරණය මනසින් දකින්න ඕන. මේ ජීවිතයේ මම මැරෙනවාය කියන කාරණය දකින්න ඕන. එහෙනම් මරණානුස්සතියට බය වෙන්න බැහැ. මැරෙනවාට

බය නම් අපට මේ ගමන යන්න බැහැ තේරුණාද. ඒ නිසා නිරතුරුවම තමා මනසින් මැරිල බලන්න කියල බුදුරජාණන් වහන්සේ කියනවා. තමා මැරිලා මළකඳ තියෙනවා ගේ මැද සාලෙ දකිමින් නිදන්න කියල කියනවා. ඒ වගේම මරණය කියන කාරණයට සූදානම් වෙන්න කියල බුදුරජාණන් වහන්සේ කියනවා. ඒ කියන්නෙ කොහොම හරි මහත්තයෝ රූපයේ අනිත්‍ය භාවය දකින ආකාරයෙන් ජීවත් වෙන්න කරන කියන කොයි දෙයක් ගත්තත් ඒක කමටහනක් බවට පත්කරගන්න. කොයි දේ ගත්තත් කමටහනක් බවට පත් කරගන්න. ගිහි අයගෙ අතහැරීම කියල කියන්නෙ අපි දක්ෂ වෙන්න ඕන තමාගේ සතුට අනුන් උදෙසා පරිත්‍යාග කරන්න. බස් එකේ වාඩිවෙලා යනකොට අපි සීට් එක කෙනෙකුට දෙන්න ඕන නම් අපිට ඒක දෙන්න බැරිනම් කවදාවත් අතහැරීමක් කියන කාරණයක් හිතන්නවත් බැහැ. අපි ඒ සීට් එක තව කෙනෙකුට දීල එයා වාඩිවෙලා සතුටින් යනව දැකල සතුටු වෙන්න අපි දක්ෂ වෙන්න ඕන. ඒක තමා ගිහි අයගේ අතහැරීම කියන්නෙ කවුරුහරි තමාට බනිනව නම් තමා එයාට හිස පහත් කරල එයාගෙ සතුට උදෙසා තමන් නිහඬ වෙන්න දක්ෂ වෙන්න ඕන.ඒක තමයි ගිහි අයගේ අතහැරීම කියන්නෙ.

එතකොට මේ අතහැරීම කියන දේ මහත්තයො ජීවිතේ හැම තත්පරේකම තමන්ට කරන්න පුලුවන් තමාගේ සැපය එයා අනුන් උදෙසා කැප කරනවා. ඒකෙන් අපට හානියක් වෙන්නෙ නෑ. ඒ කැප කරන මොහොතක් පාසාම සක්කාය දිට්ඨිය අපෙන් දුරුවෙලා යනවා. මමත්වයේ දැඩිභාවය දුරුවෙලා

යනවා. ඒ නිසා මහත්තයෝ ඔතන තමයි බුදුරජාණන් වහන්සේ සතර අපායෙන් මිදෙන්න දේශනා කරල තියෙන මාර්ගය.

ප්‍රශ්න අංක 02

ගෞරවනීය ස්වාමීන් වහන්ස ධර්මය ගැන කතා කරන කොට ධර්මයක් ඇහෙන කොට ඇඬෙන ස්වභාවයක් ඇසට කඳුලක් එන ස්වභාවයක් ඇති වෙනවා නම් ඒ ධර්මය තුල පිහිටියා වූ ස්වභාවයක්ද?

ධර්මයක් ඇහෙන කොට එයාට ඇඬෙන්න විදිහක් නැහැ තේරුණාද. ධර්මය ඇහෙන කොට එයාට ඇඬෙනවා කියන්නෙ එතන ආවේගශීලීත්වයක්. ධර්මයක් ඇහෙන කොට ඇලෙනවා එතන මොකක් හෝ අනුකම්පාවක් මොකක් හෝ හේතුවක් නිසා එතන ඇලීමක් සකස් වෙනවා. ඒ නිසා ධර්මය කියන කොට තමන්ට ඇඬෙන්න විදිහක් නැහැ තේරුණද. එහෙම ඇඬෙනව නම් එතන හැඟීම් වලට වහල් වෙනවා කියන එක. ඒ නිසා බුද්ධිමත්ව එතන දකින්න ඕන ඇඬෙන්න එනව නම් හැම වෙලාවෙම ඒ හිත අපි නතර කර ගන්න ඕන. තේරුණාද? ඒකෙ අනිත්‍ය භාවය දකින්න ඕන. යටපත් කරගන්න ඕන. ඒක හැඟීමක් ඒක ආස්වාදයක් තමන් ලබන. ඉතින් ඒ නිසා එතනදි ආශ්වාදය සකස් කරගන්න යන්න දෙන්න එපා.

ප්‍රශ්න අංක 03

ශ්‍රද්ධාව නිසා ඇඬෙන්න බැරිද ස්වාමින් වහන්ස?

ශ්‍රද්ධාව නිසා ඇඬෙන්න විදියක් නැහැ. ඉතින් එහෙම සිතුවිල්ලක් සකස් වෙනකොට ඒ සිතුවිල්ල අනිත්‍යයි කියල දකින්න. ඒකෙ අනන්තයට යන්න දෙන්න එපා. ඒ සිතුවිල්ලෙ අනිත්‍ය භාවය දකින්න. ශ්‍රද්ධාව සකස් වෙද්දි ඇඬෙන්න විදිහක් නෑ. සන්හිඳීමක් තමන් තුළ සකස් වෙන්නෙ එස්සද්දියක් තමා තුල සකස් වෙන්නේ ප්‍රීතියක් තමා තුළ සකස් වෙන්නේ අඬනවා කියන්නෙ ඒක දෝමනස්ස සහගත උපායාස කියන ගතයටයි වැටෙන්නෙ. එතනින් අපි බැහැර වෙනවා. එහෙම වුනොත් මෝහය කියන තැනටමයි අපිව වැටෙන්නේ.

බුදුරජාණන් වහන්සේ සරණ යනවා කියන්නෙ මහත්තයෝ බුදුරජාණන් වහන්සේ කිව්ව මාර්ගය සරණ යනවා. මේ සම්මා සම්බුද්ධ සාසන ලක්ෂ ගාණකදි අපිට ඒක බැරිවෙලා තියෙනව. එහෙනම් ඉතින් අපි දකින්න ඕන මේ බුද්ධ සාසනය දැන් ඉදිරියෙදි අනාගතයෙදි තව අවුරුදු 200 ක් 250 ක් නෙවෙයි තව අවුරුදු 100 ක්ද කියන්නත් බෑ. ඉන් පසුව එන්නෙ දීර්ඝ අබුද්ධෝත්පාද කාලයක් අවුරුදු ලක්ෂ ගානක අබුද්ධෝත්පාද කාලයක් ආයිමත් මෛත්‍රීය බුදුරජාණන් වහන්සේ පහල වෙන්න තව අවුරුදු ලක්ෂ ගාණක් තියෙනවා. එහෙනම් මේ දීර්ඝ අබුද්ධෝත්පාද කාල වල ආයිමත් අපිට ධර්මයක් ඇහෙන්නෙ නැහැ. මේ මාර්ගයක් අපිට ප්‍රකාශ වෙන්නෙ

නැහැ. එහෙනම් මහත්තයෝ අපි මේ ඉපදුනේ ධර්මය දකින්නමයි කියන චිත්තය අපි ඇතිකර ගන්න ඕන. වීර්යය ඇතිකර ගන්න ඕන. වීර්යය ඇතිකර ගන්න නම් ශ්‍රද්ධාවෙන් යුතුව දකින්න ඕන. ශ්‍රද්ධාවෙන් දකින්න නම් සද්ධර්මය නුවණින් මෙනෙහි කරන්න ඕන. බුදුරජාණන් වහන්සේ දේශනා කළා වූ සසර බිය තමා නුවණින් මෙනෙහි කරන්න ඕන. හිස ගිනිගත්තෙක් යම් සේද කටයුතු කරන්නේ ඒ සා වේගයෙන් මං මේකෙන් ගැලවෙනවා කියල. නමුත් ඒ ගැලවෙනව කියන කාරණේදි මහත්තයෝ අධි වේගයක් නෑ. මෙතන ඒක තේරුම් ගන්න ඕන. ඒ අන්තයටත් යන්නෑ. මේ අන්තයටත් යන්නෑ. මධ්‍යම ප්‍රතිපදාව තුළ ඉන්නවා තේරුණාද.

අතහරිනවා කියල ගිහි අයට එහෙම අතහැරීමක් නෑ. යුතුකම් වගකීම් ඉටු කරමින් මේ මාර්ගය තුළ යනවා. ඒක තමා විශාකාව උපමාවට ගන්න ඕන. අනේපිඩු සිටුතුමා උපමාවට ගන්න ඕන. නකුල මාතා නකුල පියා උපමාවට ගන්න ඕන. ඒගොල්ලො යම් සේද දුවා දරුවන්ගෙ, බිරිඳගෙ, රටේ රාජ්‍යයේ, සාසනේ යුතුකම් වගකීම් ඉටු කරමින් මාර්ගය තුල ශක්තිමත්ව ඉස්සරහට ගියේ, අන්න එතනයි අපි ඉන්න ඕන මහත්තයෝ තේරුණාද ඒ නිසා අතහරිනවා කියල අන්තයටම අතහරින්න යාමක් නෙමෙයි. එහෙම කලොත් එතන මෝහය තේරුණාද. යුතුකම් පක්ෂය ඉටුකරමින් යුතුකමත් කුසලයක් හැටියට ගන්නවා ඒ කුසලයත් විදර්ශනා නුවණට ලක් කරන්න ඕන. රකින සිල් පදය වගේම බිඳෙන සිල් පදයත් විදර්ශනා නුවණට ලක් කරල සෝවාන් වෙන්න පුලුවන්. ඒ නිසා රකින

සිල් පදය වගේම බිඳෙන සිල් පදය දක්ෂයා ප්‍රයෝජනයට ගන්නවා. බිඳුනත් සිල් පදය අපි විතර්ක සකස් කරගෙන අකුසල් කරගන්නෙ නැහැ. දැන් අංගුලිමාල මිනිස්සු නමසිය අනූනවයක් මරලනෙ එන්නෙ බුදුරජාණන් වහන්සේ ඉස්සරහට. නමුත් ඒ සියලුම අකුසල ධර්මයන් එයා එක ක්ෂණයෙන් අනිත්‍යයි කියල දැක්ක. ඒ මොකද අනිත්‍ය සංඥාව ඒ සියල්ලටම වඩා ප්‍රබලයි. ඉතින් එතන්ට තමයි අපි හිත ගන්න ඕන මහත්තයෝ අන්තයකට යන්න බැහැ. අන්තයකට ගියොත් මෝහයට වැටෙන්නෙ. අපි ආයිමත් කැරකිල ආයිමත් කැරකිල යනවා අන්තයකට, යුතුකම් ඉටුකරමින් එම යුතුකමත් කුසලයක් හැටියට දකිමින් ඒ කුසල සංස්කාරයත් අනිත්‍යයි කියල දකින්න ඕන. එතකොට යුතුකම් කවදාවත් තමන්ගෙන් බැහැරට යන්නෙ නැහැ. එතකොට යුතුකමත් ඉටුවෙලා අවසානෙදි අපි තුළ ධර්මයත් වැඩෙනවා. එහෙම තමයි ඒක කෙරෙන්න ඕන. අතහරිනවා කියල අන්තවාදී අතහැරීමක් නැහැ.

දැන් එක ස්වාමීන් වහන්සේ කෙනෙක් හිටියා තුන්සිවුරයි පාත්‍රයයි අවසානෙදි පාවිච්චි කළේ. නමුත් කල්‍යාණමිත්‍ර ආශ්‍රයක් එයා ලැබුවෙ නැහැ. අවුරුදු පහලොවක් විතර පැවිදි වෙච්ච හාමුදුරුවො නමක්. නමුත් එයා අවසානෙදි එයා හිතනවා මේ තුන්සිවුරයි පාත්‍රයත් මං අල්ලා ගැනීමක් එතනත් තියෙන්නෙ අල්ලා ගැනීමක්! බුදුරජාණන් වහන්සේ එවැනි සීමාවක් කියන්නෙ නැහැ. නමුත් මේ හාමුදුරුවො හිතනවා බුදුරජාණන් වහන්සේත් ඉක්මවා ගිහිල්ල තුන්සිවුරයි පාත්‍රයත්

අල්ලා ගැනීමක්. ඒ නිසා එයා කරපු දේ තුන්සිවුරයි පාත්‍රයත් දාල ඉන්දියාවට ගිහිල්ලා නිගණ්ඨ ආශ්‍රමයකට ගිහිල්ල දැන් අමුඩයක් ගහගෙන ජීවත් වෙනවා. මොකද අන්තයට ගියා. එවැනි අන්තයක් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නෙ නැහැ. මධ්‍යම ප්‍රතිපදාවයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නෙ.

ඒ නිසා කොතැනකවත් අපි දූවා දරුවන් දාල බිරිඳවත් දාල ව්‍යාපාර අතහැරල සෝවාන් ඵලයට යන්න ගිහි අයට කියන්නෙ නැහැ. ඒවා අයිති පැවිදි ජීවිතේ පැවිදි අයට ඒක තියෙන්නෙ. ගිහි අය කියන්නෙ විශාකාව ජීවත්වුනේ යම් සේද අන්න තමා තුළින් කරන ක්‍රියාවන් තුළින් මේ හැමදෙයක්ම අනිත්‍ය දකිමින් ඒවා කරන්න කුසල් වැඩුවා දන් දුන්න ඒවා කළා. ඒ සියල්ල කලේ අනිත්‍ය වඩවා ගනිමින් කළ යුත්තේ මධ්‍යම ප්‍රතිපදාව තමයි. අන්තයට යන්න බැහැ තේරුණාද?. මං කිව්වෙ දැන් එක්කෙනෙක් අන්තයට ගියා කියල එහෙම අන්තයට යන්න බැහැ. අපි දැන් ගිහිල්ලා භාවනා කරන්න යනවා කියල භාවනා කරන්න ගිහිල්ලා හවසට ඇවිල්ලා ස්වාමි පුරුෂයාට කෑම ටික හදලා දෙන්නෙ නැත්තම් එතන එක අන්තයක්. එහෙම වෙන්න බැහැ. එයා භාවනා කරනවා හරි. නමුත් මෙතන යුතුකම් පක්ෂයක් එයාට තියෙනවා තේරුණාද?. ඒ යුතුකම් පක්ෂය එයා තුළින් ඉටුවෙන්න ඕන. එතකොට අපි එහෙම කරන්නෙ නැතුව අන්තයටම යනවා, මං දැන් ඕව කරන්නෙ නැහැ, මට ඕව වැඩක් නැහැ කියල එහෙම යන්න එයාට බැහැ. මෙහි අනිත්‍ය දකිමින් ඒක කරන්න.

මොන රූපයක් දැක්කත් ඒක අනිත්‍ය සංඥාවට වඩන්න තේරුණාද?. තමන් ඉස්සරහට සේවාදායකයෙක් ආවොත් එයාව සතුටු කරල අරින්න. ඒ සතුටත් තමාට අත්වෙන්නා වූ කුසලයක් තේරුණාද?. තමන්ට එක පරිත්‍යාගයක් කරන්න පුලුවන් නමුත් ඒ පරිත්‍යාගය තුළින් එයා සතුටු වෙනවා දකින්න තමන් කැමති වෙන්න ඕන. දැකල ඒ සතුට තුළත් අනිත්‍ය භාවය තමන් වඩන්න දක්ෂ වෙන්න ඕන තේරුණාද?. ඒ වගේ තමයි කොයි දේත් අපි අපේ ජීවිතේ රූපයන්ට තියෙන බැඳීම අඩුවෙන දිශාවටයි දකින්න ඕනේ. මොකද මැරෙන වෙලාවට දරුව මතක් වුනොත් දරුව අනිත්‍යයි කියල දකින්න අපි දක්ෂ වෙන්න ඕන. මැරෙන වෙලාවෙ බිරිඳ මතක් වුනොත් බිරිඳ අනිත්‍යයි කියල රූපය අනිත්‍ය වශයෙන් දකින්න අපි දක්ෂ වෙන්න ඕන. එහෙම නැතිනම් ඒට අදාල ප්‍රතිසන්ධියකට යනවා. අනිත්‍ය දැක්කා කියන්නෙ ධර්මයයි දකින්නෙ. ධර්මය දකිනවා කියන්නෙ මාර්ගඵල ලාභී දෙවියෙක් මාර්ගඵල ලාභී දිව්‍යාංගනාවක් බවට පත්වෙනවා. ඊට වැඩිය හොඳ තැනක් කොහේද. ඒ කියන්නෙ සෝවාන් ඵලයට පත්වුනා කියන එක තේරුණාද?. මොනවද අවසාන චුති සිතේදි ධර්මයයි දකින්නෙ ආයිමත් මේ ජීවිතයේදි මනුස්සයෙක් වෙන්න නම් හිතන්නවත් එපා. ඔබට මේ ධර්මය තව ටික කාලයයි ඇසෙන්නෙ. අර්ය අෂ්ඨාංගික මාර්ගය චතුරාර්ය සත්‍ය තව ටික කාලයයි ඇහෙන්නෙ. මේ ධර්මය අතුරුදහන් වෙලා යනවා. ඊට පස්සෙ ඔබලාට ඇහෙන්නේ පංච උපාදානස්කන්ධය සැපයි කියන ධර්මය තේරුණාද?. ඒ නිසා මේ මොහොතේ මනුස්ස ලෝකයේ ඉපදෙනවා

කියන්නෙ තව තව දුකකට වැටෙනවා. බුදුරජාණන් වහන්සේ කියනවා අදට වඩා හෙට හොඳ වෙන්නෙ නැහැ කියල . අදට වඩා හෙට හොඳ වෙන්නෙ නැත්තෙ මනුස්සයා දුස්සීලභාවයට යන්න යන්න තව ලෝකය පිරිහෙනවා තේරුණාද?. ඒ නිසා බුද්ධෝත්පාද කාලේ මනුස්ස ලෝකයේ තමයි අපිට පිං දහම් කරන්න පුලුවන්. නමුත් පුතේ දැන් මේ සාසනේ අවරට යන කාලේ ආයිමත් මේ වෙලාවෙ මනුස්සයෙක් වෙන්න හිතන්න එපා. මනුස්සයෙක් වෙන්න ගියොත් ඔබ හෙට අනාථ වෙනවා. මොනවද ඊලඟ ජීවිතේ අපි තව අවුරුදු 20 ක් ගියාට පස්සෙ ඔබට මේ ධර්මය ඇහෙන්නැති වෙන්න පුලුවන්. ඒ නිසා නැවත මනුස්සයෙක් වෙනව කියන චිත්තය සකස් කරගන්න එපා. බුදුරජාණන් වහන්සේ කියනවා අනිවාර්යයෙන්ම මේ ජීවිතයේ මාර්ගඵල ලාභී දෙවියෙක් දිව්‍යාංගනාවක් වෙන්න කියල. මේ ජීවිතයේදී ගන්න පුලුවන් ධර්මය ගන්න ආපසු ජීවිතයක් ගැන හිතන්න යන්න එපා කියල. ඔබ දෙවියෙක් කියන තැනට ගියොත් නිකන් හරි දෙවියෙක් වුණොත් ඔබ ආපසු පහළට චුත වෙනවා. අවුරුදු 2500 ක දිව්‍ය තලයක ඉඳල ඔබ පල්ලෙහාට චුත වුණොත් ඔබ වැටෙන්නෙ එදාට ඉන්න මුස්ලිම් අම්මා කෙනෙකුගෙ හින්දු අම්මා කෙනෙකුගෙ ක්‍රිස්තියානි අම්මා කෙනෙකුගෙ කුසකට. බෞද්ධ අම්මා කෙනෙක් ලෝකෙ නැහැ. ඉතින් ඒ වගේ අනතුරක් තමයි ලෝකෙ තියෙන්නෙ. ඒ නිසා මේ මොහොතේ ඔබ කරන්න ඕන අනිවාර්යයෙන්ම මේ ජීවිතයේ නැවත උපතක් නැති තැනකට යන්න. ඒක සෝවාන් ඵලයට පත්වුන කෙනා හරියටම ආත්ම භාව හතක් තුලට යනවා. නමුත් එයා ආයිමත්

පල්ලෙහාට වැටෙන්නෙ නැහැ. දිව්‍ය තලවල විතරයි ආපසු මනුස්ස ලෝකයට කොතනකවත් ආව කියල මං දැකල නැහැ. ඒත් එයා දිව්‍යතල බ්‍රහ්මතල වලින්ම එයා නිවන් අවබෝධය කරා යනවා. ඒ නිසා ආයිමත් එයාට ප්‍රශ්නයක් මතුවෙන්නෑ. ඒ නිසා එතනයි සිත පිහිටන්න ඕන. මේ වෙලාවෙ කරගන්න තියෙන දෙයක් කරගන්න ඕන. ආයෙමත් ඊළඟ ජීවිතයක් ගැන හිතන්න එපා.

බුදුරජාණන් වහන්සේ කියනවා මේ ජීවිතයේ චතුරාර්ය සත්‍ය අවබෝධ කරගන්න නම් ඔබට කාරණා තුනක් ඕන කියල. එක තමා තෙරුවන් කෙරෙහි වූ ශ්‍රද්ධාව. දෙවෙනි කාරණය වීර්යය. තුන්වෙනි කාරණය හිරි ඔතප් ලැජ්ජාව භය සීලය. ඔබ තුල වීර්යය නැත්නම් ප්‍රශ්නය තියෙන්නෙ ශ්‍රද්ධාවෙ. ඔබ තුල වීර්යය නැහැ කියන්නෙ ඔබ තුල තාම ශ්‍රද්ධාව සකස් වෙලා නැහැ. බුදුරජාණන් වහන්සේ රූපය දුකයි කියල කියද්දී බුදුරජාණන් වහන්සේ වේදනාව අනිත්‍යයි කියල කියද්දී බුදුරජාණන් වහන්සේ සංස්කාර අනිත්‍යයි කියල කියද්දි ඔබ ඒවා නිත්‍යවශයෙන් ගන්නා නිසයි ඔබේ සිත රූප පස්සෙ දුවන්නෙ. දැන් ඔබේ සිත භාවනාවට යොමුවෙන්නෙ නැතුව දුවනවා කියන්නෙ රූපයන් පස්සෙනෙ දුවන්නෙ. ඇයි ඒ රූපය පස්සෙ යන්නෙ ඔබ තාම දරුවා කියන රූපය බිරිඳ කියන රූපය ස්වාමිපුරුෂයා කියන රූපය ගේ දොර ඉඩකඩම් කියන රූපය මේ රූපය නිත්‍ය වශයෙන් ගන්නවා. එතකොට දැන් මේ රූපය නිත්‍ය වශයෙන් ගන්නෙ කුමක් නිසාද. තාම තමා තුල ශ්‍රද්ධාව සකස්වෙලා නැහැ තේරුණාද?.

හේතුඵල ධර්මයක්. වීර්යය සකස් වෙන්නෙ නැතිනම් වීර්යය පස්සෙ නෙමෙයි හඹාගෙන යායුත්තේ. වීර්යය සකස් කරන්න හේතුව තමයි ශ්‍රද්ධාව. ශ්‍රද්ධාව සකස් වුන කෙනා තුල වීර්යය සකස් වෙනවා ඇයි ශ්‍රද්ධාව සකස් වුනොත් එයා දකිනවා ලෝකේ බියකරු භාවය. බුදුරජාණන් වහන්සේ ලෝකයේ බියකරු භාවය, භවයේ බියකරු භාවය තමයි ධර්මය තුලින් කියන්නෙ. ඔබ දකිනවා බුදුරජාණන් වහන්සේ කියන ධර්මය තුල අතීතයේ සම්මා සම්බුද්ධ සාසන ලක්ෂ ගණනක් පැවතියා කියල ඒ පැවති සෑම සම්මා සම්බුද්ධ සාසනයකම ඔබ දෙවියෙක් බ්‍රහ්මයෙක් මනුස්සයෙක් තිරිසන් සතෙක් සතර අපායෙ සතෙක් හැටියට හිටිය කියල දකිනව කියලා කියන කොට අම්මලා නිසා ඔබ හෙලූ කඳුලු මහා සාගරයට වඩා වැඩියි කියල බුදුරජාණන් වහන්සේ කියනකොට දකිනකොට ඔබ අතීතයේ මැරුණා වූ මළකඳන් ප්‍රමාණය ගොඩක් ගැහුවොත් ගිජ්ජකූට පර්වතය ප්‍රමාණය පරදිනවා කියල දැනෙනකොට අන්න සංසාර බිය සකස්වෙනවා. නමුත් තාම එහෙම හිතන්නැත්තම් අපිට සංසාර බිය සකස්වෙන්නෑ. බය සකස් වෙන්නෙ නැත්නම් වීර්යය සකස් වෙන්නෙ නැහැ තේරුණාද?. ප්‍රශ්නය තියෙන්නෙ ශ්‍රද්ධාවෙ. ඉතින් එතන ශ්‍රද්ධාව මතු කරල ගන්න ඔබ මොකද්ද කරන්න ඕන වැඩි වැඩියෙන් කල්‍යාණ මිත්‍ර ආශ්‍රයන් සොයන්න ඕන. වැඩි වැඩියෙන් සද්ධර්ම ශ්‍රවණය ලබන්න ඕන. ඒ ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කරන්න ඕන. අන්න එතකොට ශ්‍රද්ධාව සකස් වෙනව එහෙම නැත්තම් අපි වැඩි වැඩියෙන් කරන්නේ ලෝකයා දිහා බලන එකනම් රූපවාහිනී දිහා බලන

එකනම් පුවත්පත් දිහා බලන එකනම් සමාජය ලෞකික පැත්ත වඩන අය එක්කනම් ඇසුරු කරන්නෙ කවදාවත් අපිට මේ පැත්තක් වැඩෙන්නෙ නැහැ. ඒ නිසා ඔබ වැඩිපුරම කල්‍යාණ මිත්‍රයින් සොයාගෙන යන්න ඕන. නිතර කල්‍යාණ මිත්‍රයින් සොයාගෙන ගියාම ඒ ගොල්ලන් එක්ක ලැබෙන්නෙ මොකද්ද?. සද්ධර්මය ලැබෙන්නෙ එතකොට ශ්‍රවණය කරන සද්ධර්මය නුවනින් මෙනෙහි කරනකොට අන්න ඔබට වීර්යය සකස් වෙනවා. තාම අපිට සංසාර බය සකස්වෙලා නැහැ. අපි හිතන්නෙ ගිය ජීවිතයේ මං හිටිය මේ ජීවිතයේ මං ඉන්නවා මැරිල ගිහිල්ලා ඉපදෙනවා කියන කාරණය. බුදුරජාණන් වහන්සේ එහෙම දෙයක් නෙමෙයි කියන්නෙ බුදුරජාණන් වහන්සේ අර සා ඈත අතීතයක අපි ආවා වූ ගමන කියනවා.

එක බමුණෙක් බුදුරජාණන් වහන්සේගේ කාලයේදී එයාට කල්පනා වෙනවා මම කවුරුවත් මැරුණෙ නැති තැනක මාව වළලන්න ඕන කියල තේරුණාද?. එයා හිතනවා මේ හැම තැනකම කවුරුහරි මැරිල තියෙනවා වළලලා තියෙනවා ඒ නිසා මම මැරුණහම පස්සෙ වළලන්න ඕන කවුරුවත් මැරුණෙ නැති තැනක කවුරුවත් වළලපු නැති තැනක. ඉතින් මෙයා සේවකයොත් එක්ක කැලේ හොයාගෙන හොයාගෙන ගියාම මෙයාට පේනවා විශාල නුග ගසක්. මෙයා හිතනවා මේ නුග ගහේ මුල නම් කවදාවත්ම කවුරුවත්ම වළලලා නැහැ කියල කියනවා. දැන් සේවකයින්ට කියනවා මෙතන වළක් කපන්න මං කවදාහරි මැරුණට පස්සෙ මේ වලේ තමයි භූමදාන ආදාහනය කරන්න ඕන කියල. මෙහෙම කියනකොට

බුදුරජාණන් වහන්සේ ඇවිල්ල අහනවා බමුණ ඔබ මොනවද කරන්නෙ කියල. නෑ ස්වාමීන් වහන්ස මම කවුරුත් වලදාපු නැති තැනක මගේ මිනිය වළදාන්නයි යන්නෙ මැරුණට පස්සෙ කියල . ඒ වෙලාවෙ බුදුරජාණන් වහන්සේ සිනා පහල කරල කියනවා බමුණ ඔබ සංසාරෙ ඉපදුන ආත්ම භාවයන් 13000 ක් ඔබ මෙතන වළලලා තියෙනවා කියලා. එතකොට බලන්න සංසාරෙ කොයි සා දුරක තැනක් ද කියල. ඒ නිසා ඔබ සංසාරෙ ඉපදිලා වළලපු නැති තැනක් මේ ලෝකෙ නැහැ කියල කියනවා. ඒ සා දීර්ඝ ගමනක් අපි ඇවිල්ලා තියෙනවා සමහර සම්බුද්ධ සාසනවල අවුරුදු 60000 ආයුෂ සමහර සම්බුද්ධ සාසන වල අවුරුදු 50000 ආයුෂ සමහර සම්බුද්ධ සාසන වල අවුරුදු 40000 ආයුෂ දැන් මෛත්‍රීය බුදුරජාණන් වහන්සේ පහල වෙනකොට අවුරුදු 80000 ක් ආයුෂ. ඒ සා දීර්ඝ කාලයක් සංසාරෙ ගතකරල තියෙනවා.

ඒ ආකාරයෙන් ඔබ සක්විති රජවෙලා ඉපදිලා ඇත්නම් එයාට ස්ත්‍රී රත්නය වෙලා ඉපදිච්ච වාරේ එක ජීවිතයකදි පුත්තු 1000 ක් ඔබ ලබල තියෙනවා. මොකද අවුරුදු 84000 ක් ආයුෂ පුත්තු 1000 ක් ඔබට හිටියා අද ඉන්නෙ දෙන්නයි තුන්දෙනයි. එදා ඔබට පුත්තු 1000 ක් හිටිය කියල කියනවා. එහෙනම් බලන්න කොයි සා නම් සංසාරෙ ගැඹුරක් තියෙනවද. ඒ ගැඹුර දකිද්දි මොකද්ද දකින්නෙ. වීර්යයමයි සකස් වෙන්නෙ. ඒ ගැඹුර දකින්නෙ නැහැ කියන්නෙ අපි තාම ශ්‍රද්ධාව සකස් කරගෙන නැහැ.

එහෙනම් වීර්යයේ ප්‍රශ්නයක් තියෙනව නම් සද්ධර්ම ශ්‍රවනය කරමින්ම කල්‍යාණ මිත්‍ර ඇසුර ලබමින්ම ධර්මය නුවණින් මෙනෙහි කරන්න. ඒක තමා කරන්න තියෙන්නෙ.

ප්‍රශ්න අංක 04

ස්වාමින් වහන්ස ධර්මය වඩන අයට මාරයා බාධා කරනවද?

ඔබලාට පුතේ මාරයා බාධා කරන්නෙ නැහැ. මාරයා කියල බුදුරජාණන් වහන්සේ තැන් තුනක් කියනවා. එකක් හිත කියන්නෙ මාරයා කියල බුදුරජාණන් වහන්සේ කියනවා. රූපය මාරයා කියල බුදුරජාණන් වහන්සේ කියනවා. ඒ කියන්නෙ මේ දෙකම අපිට පංච උපාදානස්කන්ධය කියල ගන්න පුලුවන්. ඊට පස්සෙ මාරයා කියනවා අර වසවර්ති දිව්‍යතලයේ ඉන්න මාරයට. ඒ වසවර්ති දිව්‍යතලයේ ඉන්න ප්‍රධාන දිව්‍ය පුත්‍රයා මාරයා තේරුණාද?. ඒ වසවර්ති දිව්‍ය පුත්‍රයා කවදාවත් අපිට බාධා කරන්න එන්නෙ නැහැ. එයා එක්කො කෙනෙක් රහත් භාවයට පත්වෙන කොට නැත්නම් කෙනෙක් සම්මා සම්බුද්ධත්වයට පත්වෙන්න එනවා නම් තමයි එයා බාධා කරන්න එන්නෙ. ඉන් එහා අපිට මාරයා කියල බාධා කරන්න එන්නෙ අපේ හිත නැත්නම් රූපය තේරුණාද?. රූපයයි හිතයි තමයි මාරයා බවට පත්වෙන්නෙ. ඒ නිසා හැම වෙලාවෙම හිත මාරයා හැටියට දකින්න. රූපය මාරයා හැටියට දකින්න කියල බුදුරජාණන් වහන්සේ කියනවා. දැන් අපේ ඉස්සරහට කවුරුහරි එනවා එයා අපේ තරහකාරයෙක්. නමුත් බුදුරජාණන් වහන්සේ කියනවා රූපය මාරයා. නමුත් අපි

ඉස්සරහට එන්නෙ මාරයා කියල දකින්නෙ නැහැ. දකින්නැති කොට දැන් එයා ආපුවම ප්‍රශ්නයක් ඇති කරල අපි අකුසලයක් කර ගන්නවා. නමුත් රූපය ඉස්සරහට එනකොට මේ මාරයා කියල දැක්ක නම් ඔබ කවදාවත් අකුසලයක් ඇතිකර ගන්නවද නැහැ. ඒනිසා රූපය මාරයා කියල දකින්න කියනවා සකස් වෙන්නා වූ සිත ඔබ නිත්‍යවශයෙන් ගත්තොත් සමහරවිට ඔබ අප්‍රමාණ ප්‍රශ්න අපි ඇතිකර ගන්න පුලුවන්. විතර්ක සකස් කරගෙන තව ගොඩාක් වැරදි සිද්ධකර ගන්නවා. එහෙනම් හිතක් සකස් වෙනකොට ඒ හිත මාරයා කියල දැක්කනම් ඔබ එතනින් එහාට යනවද?. නැහැ. එහෙනම් ගිහි පිංවතුන්ලාට මාරයා බවට පත්වන්නේ කවුද?. පංච උපාදානස්කන්ධයයි. ඒ නිසා සිත මාරයා හැටියට දකින්න. රූපය මාරයා හැටියට දකින්න. රූපය මාරයා හැටියට දකිනවා නම් කවදාවත් ඔබ රූපයත් එක්ක ගැටෙන්න යන්නෙ නැහැ.

එක මහත්තයෙක් හිටිය ගෙදරට හාමුදුරුවො කෙනෙක් වැඩියා ටිකට් පොතක් අරන් ටිකට් වගයක් විකුණන්න. ටිකට් එකක් රුපියල් 25යි. ඒ මොකද්ද ළමා නිවාසෙකට කියල. මේ මහත්තයා කරපු වැඩේ ඒ හාමුදුරුවොන්ට නොසෑහෙන්න බැන්න. මෙහෙම විනය ප්‍රශ්න තියෙනවා ඔයගොල්ලන්ට සල්ලි අල්ලන්න බැහැ කියල බැනල නිකන් හිටියෙ නැහැ හැම කෙනාටම කිය කියත් බනිනවා. බලන්න දැන් කොච්චරනම් අකුසලයක්ද මේ මනුස්සයා සිද්ධකර ගන්නෙ. එයා ඒ හාමුදුරුවො වශයෙන් ආවෙ මාරයා කියල දැක්කෙ නැහැ. ඒ හාමුදුරුවො නිසා සකස් වුනාවූ සිත මාරයා හැටියට දැක්කෙ

නැහැ. දකින්නැති නිසා එයා අප්‍රමාණ වූ අකුසල් ගොඩක් කරගන්නවා. නමුත් එයා ඒ හාමුදුරුවො මාරයා හැටියට දැකල ටිකට් එකක් රුපියල් 25ක් දීල ගත්ත නම් ඔය ප්‍රශ්නය තියෙනවාද. එහෙම නැත්නම් හාමුදුරුවනේ මගේ ලඟ සල්ලි නැහැ දැන් කරන්න දෙයක් නැහැ කියල යැව්ව නම් ඔය ප්‍රශ්නෙ තියෙනවද?. නැහැ. ඇයි එයා මාරයා හැටියට දැක්කෙ නැහැ. එහෙනම් ගිහි පිංවතුන්ලාට මාරයා බවට පත්වෙන්නෙ කවුද. රූපයත් හිතත් කියන පංච උපාදානස්කන්ධයි. වසවර්තිය එන්නෙ ඉස්සරහට එයා අපි ලඟට එන්නෙ නැහැ. ද්වේෂයත් මාරයා හැටියට දකින්න ඕන. පංච උපාදානස්කන්ධයක්නෙ ද්වේෂය කියන්නෙත්. ද්වේෂය අපි නිත්‍යවශයෙන් ගත්තොත් අප්‍රමාණ අකුසල් කර ගන්නවා.

ප්‍රශ්න අංක 05

ස්වාමීන් වහන්ස මග හැරයාමෙන් කෙලෙස් ප්‍රහාණය කරගන්න පුලුවන් නේද?

බුදුරජාණන් වහන්සේ සබ්බාසව සූත්‍රයේ කියනවා මග හැරයාමෙන් දුරුකිරීමෙන් සංවරවීමෙන් වීර්යයෙන් ප්‍රත්‍යවේක්ෂාවෙන් දර්ශනයෙන් සමථවිදර්ශනාවෙන් කෙලෙස් හීන වෙනවා කියලා.

බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා නපුරු සතුන් මග හැර යන්න. ස්ත්‍රීන් ගැවසෙන ස්ථාන මග හැර යන්න. සෝෂාකාරී ස්ථාන මග හැර යන්න කියලා. පිංවත් ඔබ කැලෑ මාර්ගයක

වඩිනකොට ඔබ ඉදිරියට අලියෙක් පැමිණියොත් එම අලියා ඉදිරියට යන්න එපා. එම සතාව මග හැර යන්න කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. මොකද ඔබ එම අලියා ඉදිරියට ගියොත් ඔබට එම සතා අනතුරක් කරන්න පුළුවන්. සමහරවිට එම අලියා ඔබව දැක දුවන්නත් පුළුවන්. එහෙම වුණොත් ඔබ තුල මාන්නයක් ඇතිවෙන්න පුළුවන්. මගේ ශීලයට, මගේ සමාධියට, බියෙන් අලියා පලා ගියාය කියලා. මේ හේතුව නිසාම අපි තුල කෙලෙස් වැඩෙන්න පුළුවන්. එම නිසායි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ නපුරු සතුන් දැක්කම මග හැර යන්න කියල.

ප්‍රශ්න අංක 06

ස්වාමීන් වහන්ස ප්‍රත්‍යවේක්ෂාව කියන්නෙ?

ප්‍රත්‍යවේක්ෂාව කියන්නෙ මහත්තයො ආහාරයක් ගන්න කොට ඒ ආහාරය ප්‍රත්‍යවේක්ෂා කරනවා. මේක පිලුනුභාවයට පත්වෙන දෙයක්. මේක වමනයට අයිති දෙයක්. මේක අසූචියට අයිති දෙයක් කියල . එයා ආහාරය පිළිකුල් සංඥාවට ගන්නවා. ඒක තමා ප්‍රත්‍යවේක්ෂාව කියන්නෙ. ආහාරයෙන් ආයුෂ, වර්ණය, සැපය, බලය ලැබෙන්නෙ. ඒ ආයුෂ, වර්ණය, සැපය, බලය අනිත්‍යයි. මම මේ ආහාරය වළඳන්නේ මගේ ශරීරයේ මදය පිණිස සැපය පිණිස නොවෙයි. මාගේ බ්‍රහ්ම චර්යා ජීවිතය පවත්වාගෙන යාම සඳහා කියල. ඒක තමා ප්‍රත්‍යවේක්ෂාව. ආහාරයක් වේවා ඇඳුම් වේවා නිවාස වේවා බෙහෙත් වේවා හැමදෙයක්ම ප්‍රත්‍යවේක්ෂාවෙන් ගන්නවා.

ඒවා තුළින් අපි තුල විදර්ශනා නුවණ සකස් වෙනවා. ඒවා සකස් වුණොත් තමා අවසානෙදි සමථ විදර්ශනාව ශක්තිමත්ව වඩන්න පුලුවන් වෙන්නෙ.

ධර්ම දානමය පිංකමේ පිං අනුමෝදනාව

මෙම ධර්ම දානමය පිංකමෙන් මටත් මාගේ කල්‍යාණමිත්‍ර සැමදෙනාටමත් ධර්ම දානය ලබා දීමට දායක වන සැමටත් හැකි ඉක්මනින් සසර දුක නිවා ගැනීමට හැකි වේවා! මාගේ මව් දෙමාපියන්ටත් පරලොව ජීවිතයේ සැපය පිණිසම හේතු වේවා!

සමන් ප්‍රනාන්දු

මහ රහතුන් වැඩි මඟ ඔස්සේ



ISBN 978-955-7887-08-1

මුද්‍රණය: ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂන්ස් සෙන්ටර්